පොදු චක්‍රලේඛ අංක. ~~01-18/2016~~ 02-124/2009 (1)

මගේ අංකය:FHB/SH/Gen/2015
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශ
385, බද්දේගම විමලවංශ මාවත, කොළඹ 10
2016 ~~අප්‍රේල්~~ මැයි මස .02. දින

සියළුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
සියළුම ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
සියළුම විශේෂ වැඩසටහන් භාර අධ්‍යක්ෂවරුන්
අධ්‍යක්ෂ, ජාතික සෞඛ්‍ය විද්‍යායතනය
සියළුම ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්
සියළුම පළාත් මහ රෝහල් අධ්‍යක්ෂවරුන්
සියළුම රෝහල් වෛද්‍ය අධිකාරීවරුන්
සියළුම විශේෂඥ වෛද්‍යවරුන්
සියළුම දිස්ත්‍රික් රෝහල් භාර/ ආයතන භාර වෛද්‍ය නිලධාරීවරුන්
සියළුම මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්
සියළුම මහ නගර සභා, ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්
සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්
සියළුම පාසල් වෛද්‍ය නිලධාරීන්

## පාසල් වෛද්‍ය පරීක්ෂණය සහ රෝහල් වෙත යොමු කිරීම

සෞඛ්‍ය අමාත්‍යංශය මගින් මීට ඉහතදී නිකුත් කරන ලද 02-124/2009 අංක දරණ 2009.12.16 දිනැති චක්‍රලේඛය අභිබවා මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදි.

අවශ්‍ය අවස්ථාවලදී ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ (RDHS) ඉල්ලීම මත වෛද්‍ය නිලධාරී මාතෘ හා ළමා සෞඛ්‍ය (MOMCH) හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) ගේ සම්බන්ධීකරණය යටතේ පෙර සූදානම ඇතිව පාසල් වෛද්‍ය පරීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා වෛද්‍ය නිලධාරීන් (MO/RMO/AMO) නිදහස් කිරීමට සියළුම රෝහල් ප්‍රධානීන් කටයුතු සිදුකළ යුතුය.

පාසල් වෛද්‍ය පරීක්ෂණයේදී හඳුනාගන්නා ලද ප්‍රතිකාර කළහැකි ආබාධ සහිත දරුවන්ට එම අවස්ථාවේදීම ප්‍රතිකාර ලබාදිය යුතුය වැඩිදුර පරීක්ෂණ ප්‍රතිකාර අවශ්‍ය දරුවන් පහසුකම් සහිත ආසන්නතම රෝහලේ ඇති විශේෂඥ වෛද්‍ය සායනයට යොමුකළ යුතුය.

**හෘද රෝග ඇතැයි සායනිකව සැක කරන හෝ හඳුනාගත් සියළුම දරුවන් විශේෂඥ වෛද්‍ය සායන වෙත යොමුකල යුතුය.**

හැසිරීමේ/ ඉගෙනීමේ ආබාධ සහිත දරුවන් ආසන්නතම රෝහලේ විශේෂඥ මනෝ වෛද්‍ය හෝ වෛද්‍ය නිලධාරී මානසික රෝග වෙත යොමු කළ යුතුය.

ශරීර ස්කන්ධ දර්ශකය -2SD ට අඩු (<-2SD) දරුවන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ ඇති ආසන්නතම සායනයට යොමුකළ යුතුය. ශරීර ස්කන්ධ දර්ශකය 2SD ට වැඩි දරුවන් හෝ අධික නිරක්තියෙන් පෙලෙන බවට සායනිකව හඳුනාගත් දරුවන් විශේෂඥ ළමා වෛද්‍ය සායන වෙත යොමුකළ යුතුය.

උගුර කණ නාසය පිළිබඳ ආබාධ හෝ අක්ෂි ආබාධ හෝ ඇති දරුවන් අදාල සායන වෙත යොමුකළ යුතුය.
දරුවන් යොමු කිරීමේ පහසුව තකා ආසන්නතම රෝහල වල අදාල සායන පවත්නා දින පිළිබඳ කැලැන්ඩරයක් සියළු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් විසින් පවත්වා ගත යුතුය.

පාසල් දරුවන් සඳහා සෙනසුරාදා උදේ සහ සතියේ දිනවල සවස අදාල සායන පැවැත්වීමට සියළු රෝහල් බලධාරීන් වගබලා ගත යුතුය.

වෙනත් දිනවල රෝහල්වල පැවැත්වෙන විශේෂඥ සායන වලට පාසල් දරුවන් යොමුකල විට පාසල් සෞඛ්‍ය යොමු කිරීම් පත (H 606) රැගෙන එන පාසල් දරුවන් සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතුය. මෙම දරුවන් රෝහල්වල බාහිර රෝගී සායන (OPD) හරහා යාම අවශ්‍ය නොවේ.

මෙම දරුවන් පෝලිම් වල නොතබා ප්‍රතිකාර ලබාදීමට රෝහල්/ ආයතන ප්‍රධානීන් කාරුණිකව කටයුතු කල යුතුය.

විශේෂඥ සායන වලින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් වෙත පසු දැනුම් දීමක් සිදුකල යුතුය. ( H 606 යොමුකිරීම් පත හෝ ළමා සෞඛ්‍ය වර්ධන සටහන CHDR මගින්)

තවද **ශාරීරික යෝග්‍යතාව** පරීක්ෂා කිරීමට අවශ්‍ය ක්‍රීඩා ඉසව් පිළිබඳව පාසල් බලධාරීන් දැනුවත් කරන්න. ශාරීරික යෝග්‍යතාව පිරික්සීමට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සායනයට පැමිණෙන දරුවන් ආසන්නතම රෝහලක ඇති ක්‍රීඩා වෛද්‍ය සායනයක් වෙත යොමු කරන්න.

මෙම චක්‍රලේඛයේ අඩංගු කරුණු පිළිබඳ රෝහල්වල සියළු සායන හා බාහිර රෝගී අංශවල කාර්ය මණ්ඩල දැනුවත් කල යුතුය.

**වෛද්‍ය පී. ජී. මහීපාල**
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ10.

....................................................
වෛද්‍ය පී ජී මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය